

# විපක්ෂ නායක ඉන්දීය අගමැති හමුව

ඉන්දීය අග්‍රාමාත්‍ය මන් මෝහන් සිං මහතා සහ විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා අතර නවදිල්ලි නුවර පැවැති සාකච්ඡාවලදී ඉන්දු ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික සබඳතා පිළිබඳවත්, ශ්‍රී ලංකාවේ සාම ක්‍රියාදාමය දිනෙන් දින අනතුරට පත්වීමේ අවදානම පිළිබඳවත් විශේෂ අවධානය යොමු කෙරිණි. පසුගිය වකවානුවේ ඇති වූ සිදුවීම් හේතුවෙන් සාම ක්‍රියාදාමය අවදානමකට පත්ව තිබූ බව ද ශ්‍රී ලංකා ජනාධිපතිනිය සාම ක්‍රියාවලිය ඉදිරියටම ගෙනයාමට ක්‍රියා කරන බව ප්‍රකාශ කර ඇති බව ද අවධාරණය කළ ශ්‍රී ලංකා නියෝජිත පිරිස ඒ සඳහා එක්සත් ජාතික පක්ෂයේ පූර්ණ සහයෝගය ලබා දෙන බව ද දන්වා සිටියහ. එක්සත් ශ්‍රී ලංකාවක් තුළ සියලු ජාතීන්ට පිළිගත හැකි දේශපාලන විසඳුමක් සාකච්ඡා මාර්ගයෙන් ලබා ගැනීම සඳහා තමාත්, තම පක්ෂයත් සැමවිමට ක්‍රියා කරන බව ද රනිල් වික්‍රමසිංහ මහතා විසින් මෙහිදී පෙන්වා දෙන ලදී. මේ ඉන්දීය අගමැතිවරයා සහ විපක්ෂ නායකවරයා මුණ ගැසුණු අවස්ථාවයි. මිලින්ද මොරගොඩ මහතා ද පසෙක සිටී.